DOI : 10.31357/fhssmst.2006.00653

# ජල සම්පාදන හා සනීපාරක්ෂක ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘති තුළ ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය : සමාජ විද්‍යාත්මක විවරණයක්

## (කළුතර හා මොණරාගල තෝරා ගත් ව්‍යාපෘති දෙකක් ඇසුරෙනි)

12 DEC 2006

එම්.ඒ. ලතා රංජනී මහසිංහ

ජීඑස්/එස්එස්/1573/2002

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රපති / සමාජ විද්‍යාව

2006

# ජල සම්පාදන හා සනීපාරක්ෂක ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘති තුළ ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය : සමාජ විද්‍යාත්මක විවරණයක්

(මොණරාගල හා කළුතර තෝරා ගත් ව්‍යාපෘති දෙකක් ඇසුරෙනි)


එම්.ඒ. ලතා රංජනී මහසිංහ

ජීඑස්/එස්එස්/1573/2002


සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

මෙම නිබන්ධය මාගේ ම කෘතියක් බව ද වෙනත් පුද්ගලයකු, මීට පෙර ප්‍රකාශිත හෝ ලිඛිත කිසිවක් හෝ මේ විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ප්‍රදානය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ කිසියක් උපුටා නොගත් බව මාගේ දැනීමේ හා විශ්වාසයට අනුව ප්‍රකාශ කරමි.

2006/12/12
දිනය

පර්යේෂකයාගේ අත්සන

මෙම නිබන්ධය සම්පාදනයට අදාළ උපදෙස් සපයන ලද බව සහතික කරමු.

උපදේශකවරුන්ගේ අත්සන :

1. මහාචාර්ය බී.ජ්.ටෙනිසන් පෙරේරා මහතා

   අත්සන : ........................................

   දිනය : 2006/12/12

2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මයූර සමරකෝන් මහතා

   අත්සන : ........................................

   දිනය : 2006/12/12

12 DEC 2006

**පිදුම !**

**ජීවිතය එළිය කරන්නට**

**සිප් කිරි පෙවි**

**දියතලාව ජනානන්දයේ,**

**ගුණසේකර රාමනායක ගුරුතුමා ඇතුළු**

**ගුරු දෙමාපියන්ට මෙන්ම,**

**ජයවර්ධනපුර සරසවියේ ඇඳුරුතුමන්ලාට,**

**මාගේ ඉදිරි ගමනට**

**නිරන්තර අත්වැලක් වන**

**ජීවිතය වන් වූ**

**ආදරණීය වන්නට.**

# ස්තුතිය !

මෙම පර්යේෂණයේ ආරම්භයේ සිට අවසානය දක්වා වඩාත් විමසිලිමත් ව මා දිරිමත් කළ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය එම්.සී.ස්වර්ණලතා පෙරේරා ගුරු මාතාව හද පිරි බැති සිතින් සිහිපත් කරමි.

මාගේ නැණ නුවණ පෝෂණයට පහන් ටැඹක් වූ මහාචාර්ය බී.ජ්.ටෙනිසන් පෙරේරා ගුරු පියා බැති සිතින් මෙහි දී සිහිපත් කරමි. එතුමා මාගේ උපදේශකවරයෙකු නොවන්නට මෙම පර්යේෂණය මා නොකරන්නට ඉඩ තිබුණි. පර්යේෂණයේ දී එතුමා දුන් සහයෝගය වචන කිහිපයකින් ප්‍රකාශ කිරීම දුෂ්කරය. එමෙන් ම වටිනා කාලය කැප කරමින් කාරුණිකව මඟ පෙන්වා උපදෙස් ලබා දුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මයූර සමරකෝන් ගුරු පියා ද බැති සිතින් සිහිපත් කරමි. එමෙන් අධ්‍යයන අංශයේ සෙසු ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලයටත්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සියළුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරමි.

එමෙන්ම පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දුන්, නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයත්, ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ග්‍රාමීය ජල අංශයේ කාර්ය මණ්ඩලයත් මෙහි දී සිහිපත් කරමි. එමෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී නිරන්තර සහයෝගය ලබා දුන් ගම්මානවල සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් ඇතුළු සියළුම රජයේ නිලධාරීන් හා ප්‍රජාවට ද ස්තුතිවන්ත වෙමි.

රැකියාව කරන කාල පරිච්ඡේදය තුළ මෙවන් පර්යේෂණයක් සිදු කිරීම ඉතාමත් දුෂ්කරය. එම දුෂ්කරතා මඟ හැර අවශ්‍ය පසුබිම සකස් කර දුන් ප්‍රජා විශෝධන කොමසාරිස් ආර්.එම්.විමලරත්න මැතිතුමාටත් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

එමෙන්ම මාගේ අධ්‍යාපන ගමන ගැන නිරන්තරයෙන් සතුටු වී ගෙවෙන හැම තත්පරයකම ආසිරි පතන මගේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැමත්, පර්යේෂණ ප්‍රගතිය ගැන නිතර විමසා මා දිරිමත් කරන අමරේ අයියා හා සුරංගිත් මෙහි දි හද බැතියෙන් සිහිපත් කරමි.

මෙම පර්යේෂණයේ සොදුපත් කියවීමෙන් සහයෝගය ලබා දුන් මා මිතු, අනුෂා, කාන්ති, සුසිමා, තමරා හා ඉරංගත් මෙහි දී සිහිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. එමෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සහයෝගය ලබා දෙමින් නිරන්තරයෙන් මා දිරිමත් කළ ආදරණීය වත්ත මෙහි දී සිහිපත් කරමි.

පටුන


පිටුව

පළමුවැනි පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 01 - 05 |
| 1.2 | අරමුණු හා පරමාර්ථ | 06 |
| 1.3 | පර්යේෂණ ගැටළුව හා තර්කය | 07 |
| 1.4 | නියැදිය | 08 |
| 1.5 | මූලාශ්‍ර හා ක්‍රමවේදය | 09 - 11 |
| 1.6 | අධ්‍යයන ගැටළු හා සීමා | 12 - 13 |
| 1.7 | පරිච්ඡේදකරණය | 14 - 15 |

දෙවැනි පරිච්ඡේදය - ප්‍රජා සංවර්ධනය හා සහභාගිත්ව සංවර්ධනය

| | | |
|---|---|---|
| 2.1 | ප්‍රජාව යන සංකල්පය පැහැදිලි කිරීම | 16 - 31 |
| 2.2 | සංවර්ධනය යන සංකල්පය පැහැදිලි කිරීම | 32 - 42 |
| 2.3 | ප්‍රජා සංවර්ධනය හැඳින්වීම | 43 - 55 |
| 2.4 | සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හඳුනාගැනීම | 56 - 76 |

තුන්වැනි පරිච්ඡේදය - ජල සම්පාදන ව්‍යාපෘතියේ ස්වභාවය

| | | |
|---|---|---|
| 3.1 | ආසියානු සංවර්ධන බැංකු සහායික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ලක්ෂණ හඳුනා ගැනීම | 77 - 81 |
| 3.2 | ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති ආශ්‍රිත ආයතන ව්‍යුහය හා කාර්යභාරය | 82 |
| 3.2.1 | නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය | 83 - 86 |
| 3.2.2 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 87 - 93 |
| 3.2.3 | රාජ්‍ය ආයතන | 94 - 95 |
| 3.2.4 | පළාත් පාලන ආයතන | 96 - 98 |
| 3.2.5 | රාජ්‍ය නොවන සංවිධාන | 99 - 104 |
| 3.2.6 | ප්‍රජා මූල සංවිධානය | 107 - 112 |

**හතරවැනි පරිච්ඡේදය - අධ්‍යයන ක්ෂේත්‍රය හා දත්ත විශ්ලේෂණය**


| | | |
|---|---|---|
| 4.1 | අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම | 113 |
| 4.1.1 | තිබ්බොටුගොඩ | 114 - 119 |
| 4.1.2 | පෙතිගමුව | 120 - 125 |
| 4.1.3 | රන්දෙණිය | 126 - 130 |
| 4.1.4 | කුරුගම | 131 - 135 |
| 4.2 | දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම | 136 |
| 4.2.1 | ස්ත්‍රී පුරුෂ භාවය | 136 - 137 |
| 4.2.2 | වයස් මට්ටම් අධ්‍යයනය කිරීම | 137 - 138 |
| 4.2.3 | අධ්‍යාපන මට්ටම | 139 - 141 |
| 4.2.4 | රැකියා තත්ත්වය | 142 - 143 |
| 4.3 | ජල සම්පාදන හා සනීපාරක්ෂක තත්ත්වය | 144 - 149 |
| 4.4 | ව්‍යාපෘති ප්‍රතිලාභ | 150 - 152 |
| 4.5 | සනීපාරක්ෂක හා ස්වස්ථතා අධ්‍යාපනය | 153 - 155 |
| 4.6 | ව්‍යාපෘති සඳහා ප්‍රජාවගේ සහභාගිත්වය | 156 - 173 |
| 4.7 | ව්‍යාපෘති තුළින් ප්‍රජාවට ලැබී ඇති වෙනත් ප්‍රතිලාභ | 174 |
| 4.8 | ව්‍යාපෘති අඩුපාඩු හඳුනා ගැනීම | 174 - 179 |


**පස්වැනි පරිච්ඡේදය**


| | | |
|---|---|---|
| 5.1 | සමාලෝචනය | 180 - 183 |
| 5.2 | නිගමන | 184 - 185 |
| 5.3 | යෝජනා | 186 - 187 |
| | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | |
| | ඇමුණුම් | |

# ප්‍රස්ථාර


| | | පිටුව |
|---|---|---|
| ප්‍රස්ථාර අංක 1 | රැකියාවල ස්වභාවය (තිබ්බොටුගොඩ) | 115 |
| ප්‍රස්ථාර අංක 2 | ජල හා සනිපාරක්ෂක ස්වභාවය (තිබ්බොටුගොඩ) | 118 |
| ප්‍රස්ථාර අංක 3 | රැකියාවල ස්වභාවය (පෙතිගමුව) | 121 |
| ප්‍රස්ථාර අංක 4 | ජල හා සනිපාරක්ෂක ස්වභාවය (පෙතිගමුව) | 124 |
| ප්‍රස්ථාර අංක 5 | රැකියාවල ස්වභාවය (රන්දෙණිය) | 127 |
| ප්‍රස්ථාර අංක 6 | ජල හා සනිපාරක්ෂක ඉල්ලුම (රන්දෙණිය) | 129 |
| ප්‍රස්ථාර අංක 7 | රැකියාවල ස්වභාවය (කුරුගම) | 132 |
| ප්‍රස්ථාර අංක 8 | ජල හා සනිපාරක්ෂක ඉල්ලුම (කුරුගම) | 134 |
| ප්‍රස්ථාර අංක 9 | සනිපාරක්ෂක වැසිකිළි ලැබීම් | 153 |
| ප්‍රස්ථාර අංක 10 | නිවසේ මූලිකත්වය ගැනීම | 157 |
| ප්‍රස්ථාර අංක 11 | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවීම | 167 |

# රූප සටහන් ලේඛනය

පිටුව


| | | |
|---|---|---|
| සටහන් අංක 1 | ශ්‍රී ලංකාවේ ජල ගිහය අඩුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් 1970 ට පෙර | 04 |
| සටහන් අංක 2 | දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදය | 11 |
| සටහන් අංක 3 | ප්‍රජාවගේ ආදායම් ගිලීහි යන අවස්ථා | 69 |
| සටහන් අංක 4 | විධිමත් ජල සම්පාදන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඇති වන වාසි | 81 |
| සටහන් අංක 5 | නාගරික සංවර්ධන ජල සම්පාදන අමාත්‍යාංශය | 84 |
| සටහන් අංක 6 | ව්‍යාපෘති සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලය | 88 |
| සටහන් අංක 7 | සුදුසු හවුල්කාර සංවිධානයක් සොයා ගැනීමේ ක්‍රමවේදය | 90 |
| සටහන් අංක 8 | ප්‍රජා මූල සංවිධානයේ සංයුතිය | 109 |
| රූප සටහන් අංක 9 | භූමි පරිභෝජනය (තිබ්බොටුගොඩ) | 119 |
| රූප සටහන් අංක 10 | භූමි පරිභෝජනය (පෙතිගමුව) | 125 |
| රූප සටහන් අංක 11 | භූමි පරිභෝජනය (රන්දෙණිය) | 130 |
| රූප සටහන් අංක 12 | භූමි පරිභෝජනය (කුරුගම) | 135 |

# වගු ලේඛනය


| | | පිටුව |
|---|---|---|
| වගු අංක 1 | අධ්‍යයන නියැදිය පෙන්නුම් කිරීම | 08 |
| වගු අංක 2 | ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර ලැබෙන ආකාරය | 48 |
| වගු අංක 3 | රැකියාවල ස්වභාවය (තිබ්බොටුගොඩ) | 114 |
| වගු අංක 4 | ප්‍රතිලාභ ඉල්ලුම (තිබ්බොටුගොඩ) | 117 |
| වගු අංක 5 | රැකියාවල ස්වභාවය (පෙතිගමුව) | 120 |
| වගු අංක 6 | ප්‍රතිලාභ ඉල්ලුම (පෙතිගමුව) | 119 |
| වගු අංක 7 | රැකියාවල ස්වභාවය (රත්දෙණිය) | 123 |
| වගු අංක 8 | ප්‍රතිලාභ ඉල්ලුම (රත්දෙණිය) | 126 |
| වගු අංක 9 | රැකියාවල ස්වභාවය (කුරුගම) | 128 |
| වගු අංක 10 | ප්‍රතිලාභ ඉල්ලුම (කුරුගම) | 131 |
| වගු අංක 11 | අධ්‍යයන ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ භාවය | 133 |
| වගු අංක 12 | අධ්‍යයන ක්ෂේත්‍රවල වයස් මට්ටම | 137 |
| වගු අංක 13 | අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යාපන තත්ත්වය | 138 |
| වගු අංක 14 | අධ්‍යයන ක්ෂේත්‍රවල රැකියා තත්ත්වය | 139 |
| වගු අංක 15 | අධ්‍යයන ක්ෂේත්‍රවල ජල හා සනීපාරක්ෂක තත්ත්වය | 142 |
| වගු අංක 16 | අධ්‍යයන ක්ෂේත්‍රවල නම ප්‍රකාශ කළ | 144 |
| වගු අංක 17 | ව්‍යාපෘති ප්‍රතිලාභ | 148 |
| වගු අංක 18 | සනීපාරක්ෂක හා ස්වස්ථතා අධ්‍යයනය | 150 |
| වගු අංක 19 | නිවසේ මූලිකත්වය ගැනීම | 150 |
| වගු අංක 20 | රැකියාවලට සහභාගි වීම | 153 |
| වගු අංක 21 | රැස්වීම්වලට සහභාගි වන්නේ කවුද | 154 |
| වගු අංක 22 | රැස්වීම්වලට යාමට හේතුව | 156 |

| | | |
|---|---|---|
| වගු අංක 23 | සාමූහිකව ක්‍රියා කිරීම | 158 |
| වගු අංක 24 | ව්‍යාපෘතිවලින් බලාපොරොත්තු අරමුණු ඉටුවීම | 160 |
| වගු අංක 25 | ව්‍යාපෘතියේ දී ප්‍රජාවගෙන් සිදුවන අඩුපාඩු | 167 |

# පළමුවැනි පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

ලෝකයේ සෑම රටකම ජනතාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා අධ්‍යාත්මික ජීවිතයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය ඇති කිරීම සඳහා ප්‍රජා සංවර්ධන උපාය මාර්ග භාවිතයට ගැනිණ. ශ්‍රී ලංකා සමාජය ද බොහෝ සංවර්ධන උපාය මාර්ග තුළින් ග්‍රාමීය ජනතාව සඳහා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමට උත්සාහ දරා ඇත. මීට නිදසුන් වශයෙන් සමෘද්ධි සංවර්ධන වැඩ සටහන, මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධ වැඩසටහන් ඒ අතර වේ. මෙම සෑම ව්‍යෘපාතියක ම අවසාන අරමුණ ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇති කිරීමයි.

ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා සමාජය තුළ දැකිය හැකි සුලභ ලක්ෂණය වන්නේ සංවර්ධන උපාය මාර්ග බොහෝ විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී පමණක් ප්‍රජාව සක්‍රිය ව දායක වන අතර අදාළ ව්‍යාපෘති අවසන් වූ පසුව ඒ පිළිබඳ උනන්දුව අඩු වී එම ව්‍යාපෘති ආරක්ෂා කර ගැනීමට ද උනන්දුවක් නොදැක්වීමයි. මෙම තත්ත්වය මත සුබ සාධනය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් ආරම්භ වන ව්‍යාපෘති කෙටි කාලයක් තුළ දී ජනතාව අතරින් ගිලිහී යාමක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාව තුළ 1970 ට පෙර සිට ම ප්‍රජා සංවර්ධනය සඳහා විවිධ සැලසුම් හා යෝජනා ක්‍රියාත්මක කෙරිණි. මෙහි දී සමාජ විද්‍යාඥයින් හා ප්‍රතිපත්ති සකස් කරන්නන් විසින් උපයෝගී කර ගනු ලැබුවේ සමාජ සැලසුම් න්‍යායයි. මෙම න්‍යාය තුළින් ඉහළ සිට සැලසුම් කරන ලද යෝජනා හා අදහස් පහළට ගලා එන්නට විය. මෙහි ඇති ප්‍රධාන ලක්ෂණය සැලසුම්කරුවා විසින් සැලසුම් කරන අතර, ඔහු විසින් ම ක්‍රියාත්මක කිරීම ද, ඇගයීම ද, නඩත්තුව ද සිදු කිරීමයි. තව ද මෙම සංවර්ධන ක්‍රියාවලියේ දී මුදල් සම්බන්ධව හෝ පුද්ගලයාට අවශ්‍ය කුමන

සංවර්ධනයක් ද යන්න පිළිබඳ දැනුවත් වීමක් ප්‍රජාව සතුව නැත. මෙහි දී ලාභයක් ගැනීමට ඇතැම් පිරිසක් උත්සාහ ගැනීමෙන් පක්ෂ දේශපාලන බලපෑම් නිරන්තරයෙන් ම ඇති වේ. අයිතිය පිළිබඳ හැඟීමක් නොමැති අතර ප්‍රජාව තුළ අසමගිය මේ නිසා වර්ධනය වේ. එමෙන් ම බාහිර සම්පත් දායකයින් හා නිලධාරීන් විසින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන නිසා ප්‍රජාව එකට ඒකරාශි වීමක් දක්නට නොලැබේ. මෙම ව්‍යාපෘති සඳහා ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය හා මුදල් දායකත්වය නොමැත. මෙහි දක්නට ලැබෙන තවත් ලක්ෂණයක් වන්නේ කාන්තාවන්ගේ හඬට ඇහුම් කන් නොදීමයි. මෙහි පුරුෂ පක්ෂයට පමණක් මුල් තැන හිමිව ඇත. එම නිසා කාන්තා සහභාගිත්වයක් දක්නට නොමැත.

ඉහත ලක්ෂණවලින් සමන්විත සංවර්ධන වැඩ සටහන් ජනතාවගෙන් ඈත් වූ හුදෙකලා ඒවා වේ. මෙහි භයානක ප්‍රතිඵලය වන්නේ ජනතාව සමහර අවස්ථාවල දී ඇති වන ආවේග හා ප්‍රකෝපකාරී සිද්ධිවල දී රජයේ දේපලවලට හානි කිරීමයි. එයට හේතුව තමන්ගේය යන ආකල්පය නොමැති වීමයි. මෙම දුර්වලතා නිසා ප්‍රජා සංවර්ධනය සාර්ථක කර ගැනීම උදෙසා ජනතා සහභාගිත්වය අත්‍යවශ්‍ය අංගයක් බව සැලසුම් කරුවන් හා ප්‍රතිපත්ති සකස් කරන්නන් පිළිගෙන ඇත. මෙයට විකල්පයක් වශයෙන් ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය නම් නව ප්‍රවේශයක් ඔස්සේ මෙකී ගැටළුවලට පිළියම් යෙදීමට උත්සාහ ගන්නා ලදී.

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ දී ප්‍රධාන ඉලක්කය තිරසාර සංවර්ධනයයි. මෙහි දී පහළ සිට ඉහළට සැලසුම් සකස් කෙරේ. මෙම සංවර්ධන ප්‍රවේශයේ සුවිශේෂී ලක්ෂණය වන්නේ ප්‍රජාවකගේ අවශ්‍යතාව මත ප්‍රජාව විසින් ම සැලසුම් සකස් කර, ක්‍රියාත්මක කර ඔවුන් විසින් ම පරිභෝජනය කර ඔවුන්ම ඇගයීමට පත් කරන ව්‍යාපෘතියි. මෙහි දී සියලු ම ප්‍රජාව එකට ඒකරාශි වේ. ස්ත්‍රියට ද සමාජයේ පුරුෂයාට මෙන් සමතැනක් මේ නිසා ලැබේ. කාන්තා හඬට නිතර ම ඇහුම්කන් දීමක් ද මෙයින් සිදුවේ. ප්‍රජාව ව්‍යාපෘතියේ ආරම්භයේ සිට අවසානය වන තෙක් සෑම අදියරකට ම සම්බන්ධ වන නිසා ඇගයීම හා නඩත්තුව ද ඔවුනොවුන් අතින් සිදුවේ. මෙය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකිය.